## රාජ්‍ය දැව සංස්ථාව - 2012

### 1. මූල්‍ය ප්‍රකාශන

#### 1.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2012 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය දැව සංස්ථාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

#### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

##### 1.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත

පහත සඳහන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 01 | ගිණුම් වර්ෂයන්ට අදාල සියළු ආදායම් වියදම් විස්තීරණ ආදායම් ප්‍රකාශයෙහි දැක්විය යුතු වුවද, කාර්ය මණ්ඩල ණය ප්‍රතිචක්‍රීය අරමුදලට ලද පොලිය එකී ප්‍රකාශයෙහි දක්වා නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 | (i) සංස්ථාව සතු දේපළ, පිරියත සහ උපකරණ ප්‍රත්‍යාගණනය කර නොතිබුණි. එහෙත් ශේෂය ලියා හල පසුව රු. 5 ක වටිනාකමක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු ගොඩනැගිල්ලක කොටසක් වාර්ෂිකව රු. මි. 15 ක් වූ වටිනාකමකට කුලියට දී තිබුණි. එම ගොඩනැගිල්ලේ වටිනාකම ප්‍රත්‍යාගණනය කර එහි සාධාරණ වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් නොකිරීම හේතුවෙන් සංස්ථාව සතු වත්කම්වල සහ ස්කන්ධයේ වටිනාකම අඩුවෙන් නිරූපනය වේ. එසේම එම ගොඩනැගිල්ලට අදාල ක්ෂය වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල නොගැලපීම හේතුවෙන් ලාභයද එම ක්ෂය වටිනාකමට සමාන වටිනාකමකින් වැඩියෙන් නිරූපනය විය. |

-

(ii)වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව යටතේ පැවති ඉඩම් 74 ක භුක්තිය සංස්ථාව වෙත පවරා තිබුණද, එකී වත්කම් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් නොකිරීම නිසා වත්කම් වටිනාකම් සහ ස්කන්ධයේ වටිනාකම අඩුවෙන් නිරූපනය විය.

(ඈ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 37

අසම්භාව්‍ය බැරකම් සඳහා වෙන්කිරීම් හෝ හෙළිදරව් කිරීම් සිදුකළ යුතු අතර, ඒ පිළිබඳව ප්‍රමිතයේ සඳහන් කරුණු පහත සඳහන් විෂයයන් සම්බන්ධයෙන් හෙළිදරව් කර නොතිබුණි.

- බගවන්තලාව වැපල්ටන් වාණිජ තුනීකිරීම් බිම් කට්ටියේ අනවසර හෙළීම් නිසා රු.32,462,148 ක අලාභයක් රජයට සිදුවී තිබුණි.
- රඹකැන් ඔය ජලාශයට යටවන භූමියේ දැව ඉවත් කිරීමේදී සිදුවී තිබුණු අක්‍රමිකතා සහ වන අපරාධ හේතුකොටගෙන රජයට රු.35,169,565 ක අලාභයක් සිදුවී තිබුණි.
- ගෙවියයුතු වියදම් රු. 188,667,206 ක් තුළ අන්තර්ගත රු. 65,209,269 ක ස්කන්ධභාග මුදල 2011 වර්ෂයේදී වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට ගෙවියයුතු යැයි 2013 සැප්තැම්බර් 30 දින වන විටත් එකඟතාවයකට පත් වී නොතිබුණි. එය අසම්භාව්‍ය බැරකම් සඳහා වෙන් කිරීම් ලෙස ගිණුම්වල නොදක්වා උපචිත වියදම් ලෙස දක්වා තිබුණි.
- වැඩ තහනම් කළ නිලධාරියෙකුගේ චෝදනාවලට සහ නිවැරදිකරු වීම නිසා හිඟ වැටුප් ලෙස රු.1,957,174 ක් ගෙවීමට සිදුවී තිබුණත් ඒ සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ඈ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 40

දැව සංස්ථාවට අයත් බත්තරමුල්ලේ පිහිටි ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේ කොටසක් පරිසර හා පුනර්ජනනීය බල ශක්ති අමාත්‍යාංශයට හා වන

-

සංරක්ෂණ දෙපාර්තමේන්තුවට වාර්ෂිකව රු. 15,154,488 කට කුලියට දී තිබුණද එම ගොඩනැගිල්ලේ වටිනාකම ආයෝජන වත්කම් යටතේ පෙන්වා නොතිබුණි.

### 1.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

වෙළඳ හා වෙනත් ණයගැතියන් පිළිබඳ ගිණුම්කරණ ප්‍රතිපත්තීන් අවසන් ගිණුම්වල හෙළිදරව් කර නොතිබුණි.

### 1.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්

සමාලෝචිත වර්ෂය අවසානයට වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු ස්කන්ධභාග මුදල සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන අනුව රු. 474,283,658 ක් වුවද වන සංරක්ෂණ දෙපාර්තමේන්තු ගිණුම් අනුව ලැබිය යුතු මුදල රු. 560,288,680 ක් විය. සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන හා දෙපාර්තමේන්තු ගිණුම් අතර රු. 86,005,022 ක වෙනසක් නිරීක්ෂණය වු අතර එම වෙනසට හේතුන් හෙළිදරව් කර නොතිබුණි.

### 1.2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මුළු වෙළඳ ණයගැතියන් රු. 637,121,375 ක් වු අතර එයින් රු. 405,368,846 ක් දින 90 ට වැඩි ණයගැති ශේෂයන් වේ. එය මුළු ණයගැතියන්ගෙන් සියයට 64 ක් විය.

(ආ) පෞද්ගලික ආයතනවලින් අයවිය යුතු ණයගැති ශේෂය තුළ රු. 11,873,954 ක් 1983 වර්ෂයේ සිට එක්තරා පුද්ගලික සමාගමකින් අයවියයුතු ශේෂයක් වශයෙන් පැවතුණි.

(ඇ) සංස්ථාව විසින් 1988 වර්ෂයේදී කතරගම අඡ්ධිවල අරමුදලට රු. 2,000,000 ක පොළී රහිත ණය මුදලක් ලබා දී තිබුණි. 2012 වර්ෂය තුළ ඉන් රු. 40,000 ක් ලැබී තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසානයට රු. 1,075,000 ක් තවදුරටත් අයවිය යුතුව පැවතුණි.

(ඈ) 2010 වර්ෂයට පෙර සිට පැවත එන රු. 398,627 ක් වු ගෙවියයුතු ව්‍යාපාර පිරිවැටුම් බදු ශේෂය 2013 සැප්තැම්බර් 30 දින වනවිටත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) දැව සැපයුම්කරුවන් විසින් සංස්ථාවට දැව සැපයීම සඳහා තබාතිබු ආපසු ගෙවියයුතු රු.2,270,950ක් වු වර්ෂ 2 සිට වර්ෂ 4 දක්වා වු කාලය සිට පැවත එමින් තිබුණු ටෙන්ඩර් තැන්පතු, ආදායමට ගැනීමට හෝ නිදහස් කිරීමට පියවර ගෙන නොතිබුණි.

(ඊ) විවිධ සැපයුම්කරුවන් විසින් කාර්යසාධන බැදුම්කර සඳහා තැන්පත් කළ වසර 2 සිට 6 දක්වා කාලයක සිට පැවත එමින් තිබූ රු.14,344,600 ක් ආදායමට ගැනීමට හෝ බේරුම් කිරීමට පියවර ගෙන නොතිබුණි.

### 1.2.5 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තරණවලට අනුකූල නොවීම්

මුදල් රෙගුලාසි 104 (3) සහ (4) ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු ප්‍රාරම්භක වාර්තාවන් සහ පූර්ණ වාර්තාවන් වාහන අනතුරු 19ක් සම්බන්ධයෙන් 2013 සැප්තැම්බර් 30 දින වනවිටත් ඉදිරිපත් කර නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සංස්ථාවේ බදු පූර්ව ශුද්ධ ලාභය රු. 801,681,308 ක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂය සඳහා බදු පූර්ව ශුද්ධ ලාභය රු. 603,498,864 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 198,182,444 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. 2012 වර්ෂය තුළ වෙළඳ පිරිවැටුමෙහි වූ රු. 411,346,976 ක වැඩි වීම එම වර්ධනය කෙරෙහි ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය තුළ මෙහෙයුම් නොවන ආදායමෙහි රු.58,265,410 ක් හෙවත් සියයට 36.55 ක වැඩිවීමක් පෙන්නුම් කෙරුණි. පොලී ආදායම සියයට 39.07 කින් වැඩිවීම හා විදේශ විනිමය අනුපාතය වෙනස්වීම තුළන් වු සියයට 505.27 ක ලාභය එයට හේතුවී තිබුණි.

### 2.2 ආයතනයට එරෙහිව ආරම්භ කර ඇති නෛතික සිද්ධි

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වන සංරක්ෂක දෙපාර්තමේන්තුව විසින් රාජ්‍ය දැව සංස්ථාවට එරෙහිව රඹකැන් ඔය ජලාශයට යටවන භූමියේ දැව ඉවත් කිරීමේදී සිදුවී තිබුණු අක්‍රමිකතා සහ වන අපරාධ හේතුකොටගෙන රු.35,169,565 ක්වූ රජයට සිදුවී තිබුණු අලාභය සම්බන්ධයෙන් දෙහිඅත්තකණ්ඩිය මහේස්ත්‍රාත් උසාවියට බී වාර්තාවක් ඉදිරිපත් කර තිබුණි.

(ආ) බගවන්තලාව වැපල්ටන් වාණිජ තුනීකිරීම් බිම් කට්ටියේ අනවසර හෙළීම් නිසා රජයට සිදුවී තිබුණු රු.32,462,148 ක් බවත් එම අලාභය රාජ්‍ය දැව සංස්ථාව විසින් ගෙවිය යුතු බව, වන සංරක්ෂක ජනරාල් විසින් දැනුම් දී තිබුණි.

### 2.3 කාරක ප්‍රාග්ධන කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ

(අ) ඉකුත් වර්ෂය හා සැසදීමේදී සියයට 43.3 ක් වූ දළ ලාභ අනුපාතය සමාලොචිත වර්ෂයේ දී සියයට 47.29 ක් දක්වා සියයට 3.99 කින් වැඩිවී තබුණද, ශුද්ධ ලාභ අනුපාතය සියයට 10.52 සිට සියයට 5.03 දක්වා සියයට 5.49 කින් පහත වැටී තිබුණි.

(ආ) **ද්‍රවශීලතා අනපාත**

| ද්‍රවශීලතා අනුපාතය | සම්මත අනුපාත | 2012 | 2011 |
|---|---|---|---|
| ජංගම අනුපාත | 2:1 | 3.74:1 | 4.38:1 |
| ක්ෂණික වත්කම් අනුපාත | 1:1 | 2.75.:1 | 3.24:1 |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

(අ) **දැව හා දැව ආශ්‍රිත නිෂ්පාදන**

සමාලොචිත වර්ෂයේ සංස්ථාවේ තථ්‍ය නිෂ්පාදනය, ඇස්තමේන්තුගත නිෂ්පාදනය සමග සසදා පහත දැක්වේ.

| විස්තරය | ඇස්තමේන්තුගත නිෂ්පාදනය | තථ්‍ය නිෂ්පාදනය | විචලනය වාසි/(අවාසි) | විචලනය වාසි/(අවාසි) % |
|---|---|---|---|---|
| දැව කඳන් - (ඝන මීටර්) | 90,713 | 132,859 | 42,146 | 46.46 |
| ඉරූ දැව - (ඝන මීටර්) | 6,745 | 4,955 | (1,790) | (26.54) |
| විදුලි සම්ප්‍රේෂණ කණු - (ඒකක) | 33,500 | 30,469 | (3,031) | (9.05) |
| සිල්පර - (ඒකක) | 81,300 | 117,306 | 36,006 | 44.29 |
| වට කණු - (ඒකක) | 59,450 | 152,837 | 93,387 | 157.08 |
| වැට කණු - (ඝන මීටර්) | 46,400 | 79,608 | 33,208 | 71.57 |
| දර - (ඒකක) | 53,350 | 104,316 | 50,966 | 95.53 |
| බිත්ති පනේල - (දික් මීටර්) | 30,000 | 1,850 | (28,150) | (93.83) |
| අලි වැට කණු - (ඝන මීටර්) | 34,250 | 50,674 | 16,424 | 47.95 |
| ගෘහ භාණ්ඩ-(රු.මිලියන) | 172.8 | 156 | (16.8) | (9.72) |
| දැව ආනයනය (ඒකක) | 5,000 | දක්වා නොමැත | - | |

(ආ) **ඉරූ දැව අලෙවිය**

සමාලෝචිත වර්ෂයේදී ඉරූ දැව විකිණීමේ රු.201,351,085 ක ආදායමක් ලැබී තිබුණි. සමාලෝචිත වර්ෂයේ අයවැය ගත විකුණුම් රු. 425,200,000 ක් වී තිබුණත්, එම ඉලක්කයට රු. 223,848,915 කින් හෙවත් සියයට 52.6 ළඟා වීමට නොහැකි වී තිබුණි. වෙළඳපොලේ තරඟකාරී මිල ගණන් සමඟ රාජ්‍ය දැව සංස්ථාවට කටයුතු කළ නොහැකි

-

වීමෙන් දීප ව්‍යාප්ත විකුණුම් ජාලයක් පැවතියද සමාලෝචිත වර්ෂයේද ඉරුදැව අලෙවිය ඉතා පහළ මට්ටමක පැවතුණි.

**(ඇ) ගෘහභාණ්ඩ ඒකකය**

(i) මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ සංස්ථාවේ තථ්‍ය ගෘහභාණ්ඩ අලෙවිය රු.මිලියන 126.218 ක්වූ අතර , එය රු. මිලියන 247.214 ක්වූ අයවැයගත විකුණුම්වලට වඩා රු.මිලියන 121 ක අඩුවීමකි. මෙම ඒකකයේ ශුද්ධ පාඩුව රු. මිලියන 13.12 ක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව විකුණුම් සියයට 3.67 ක් වැඩිවීම, ආයතන හා පරිපාලන වියදම් සියයට 22.63 කින් වැඩි වීම විකුණුම් හා බෙදාහැරීමේ වියදම් සියයට 43.9 කින් වැඩි වීම මෙම ඒකකයේ අලාභයට හේතු වී තිබුණි.

(ii) ගෘහභාණ්ඩවල පිරිවැය අවම කර නොගැනීම මෙම අලාභයට ප්‍රධානම හේතුව වී තිබුණි.

**(ඈ) දැව ඩිපෝ**

ඩිපෝ සඳහා පිළියෙළ කර තිබුණු ලාභාලාභ ගිණුම අනුව සමාලෝචිත වර්ෂයෙහි ලබා තිබුණ ශුද්ධ ලාභය රු.408,883,574 ක් වන අතර, ඉකුත් වර්ෂයෙහි ශුද්ධ ලාභය රු. 303,550,284 ක විය.

2012 වර්ෂයේ දැව කඳන් අලෙවිය අයවැය ගත රු.1,396,845,000 ට වඩා රු.317,310,858 ක් හෙවත් සියයට 22.72 කන් වැඩිවී තිබුණි. දැව කඳන් අලෙවිය මුළු විකුණුම් ආදායමෙන් සියයට 52.43 කි. දැව කඳන් සුළු ප්‍රමාණයක් පෞද්ගලික ඉඩම් වලින් හා පරිත්‍යාග මගින් ලද ඒවා වන අතර ඉතිරි මුළු ප්‍රමාණය වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ වන වගාවලින් ලබා ගන්නා ලද දැව වේ. මෙම දැව කඳන් කැපීම හා ප්‍රවාහනය පෞද්ගලික කොන්ත්‍රාත් මඟින් කෙරෙන අතර 2012 වර්ෂයේදී දැව කඳන් අලෙවිය වූ රු.1,739,141,867 න් සියයට 13 ක්වූ රු. 226,322,521ක් දැව කඳන් කැපීම හා ප්‍රවාහනය සඳහා ගෙවා තිබුණි.

**(ඉ) සිල්පර අලෙවිය**

සමාලෝචිත වර්ෂයේදී සමස්ත සිල්පර අලෙවිය රු.728,996,144 ක් වන අතර එය අයවැය ගත රු.670,725,000 ක අලෙවියට වඩා සියයට 8.69 ක වර්ධනයකි. දේශීය සිල්පර නිෂ්පාදනයේ ඒකාධිකාරය සංස්ථාව සතුවන අතර මේ වන විටත් නිෂ්පාදනය කරන මුළු සිල්පර ප්‍රමාණයම දුම්රිය දෙපාර්තමේන්තුව මිලදී ගනී.

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

**(අ) විශ්‍රාම පාර්තෝෂික මුදල් ගෙවීම- වැඩබිම් නිලධාරි**

දැව සැපයීමේදී සිදු වූ අක්‍රමිකතාවයන් නිසා රක්ෂිත බන්ධනාගාර ගත කර තිබූ පර්වාස කාලය තුළ සිටි වැඩබිම් නිලධාරිවරයෙකු 2002 ජුනි මස වැඩ තහනම් කිරීමෙන් පසු විධිමත් විනය පරීක්ෂණයක් නොපවත්වා නැවත සේවයේ පිහිටුවා තිබුණි. තවද මහේස්ත්‍රාත් අධිකරණයේ පැවති නඩුවේදී නිලධාරියා වරදකරුවකු වීම නිසා නැවත 2005 දෙසැම්බර් 05 දින සිට වැඩ තහනම් කර තිබුණි. එම නඩු තීන්දුව සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද අභියාචනය අනුව 2010 නොවැම්බර් මස නිලධාරියා නිදහස් වී තිබුණි. මේ අතර ඔහු අනුමැතියකින් තොරව විදේශ ගතවී තිබූ අතර, අවුරුදු 09 කට පසුව පැවැත්වූ විනය පරීක්ෂණයේදී නිලධාරියා චෝදනාවලින් නිදහස් වීම නිසා හිඟ වැටුප් සහිතව නැවත සේවයේ පිහිටවා තිබුණද එයින් දින 7 කට පසුව ඔහු සේවය අතහැර නැවත විදේශ ගතවී තිබුණි.

එම නිලධාරියා පර්වාස සේවා කාලය ඇතුළත අනුමැතියකින් තොරව විදේශගතවී තිබියදී සේවයෙන් පහ කරනවා වෙනුවට රු.119,160 ක මුදලක් පාරිතෝෂික දීමනා වශයෙන්ද, හිඟ වැටුප්, සේවා අර්ථසාධක දායකය හා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට දායකය වශයෙන් රු. 1,957,174 ක මුදලක්ද ගෙවා තිබුණි. එම ගෙවීම කළමණාකරණ අකාර්යක්ෂමතාවක් නිසා සිදු වීමක් ලෙස විගණනයේදී නිරීක්ෂණය විය.

(ආ) දැව සැපයීම් සඳහා ගෙවීම

දැව හා දැවමය නිෂ්පාදිත වරින්වර ගබඩාවෙත ලැබීමේදී එහි වටිනාකමින් රු. 12,843,873 ක් වූ කොටසක් දැව සැපයුම්කරුවන් වෙත අත්තිකාරම් ලෙස ගෙවා තිබුණි. ගබඩා සැපයුම නිමකළ දැව සැපයුම්කරුවන්ට අවසන් ගෙවීම් කිරීමේදී අත්තිකාරම් මුදල් අඩුකර ගෙවීම් කළයුතු වුවද, එසේ කටයුතු නොකිරීම නිසා දැව සැපයුම් අත්තිකාරම් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබීමෙන් දැව සැපයීම් ගෙවීම් සම්බන්ධ අභ්‍යන්තර පාලනය දුර්වල බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ඇ) **ගිණුම්කරණ තොරතුරු පද්ධතියක් ප්‍රසම්පාදනය කරගැනීම**

පරිගණක ගිණුම්කරණ තොරතුරු පද්ධතියක් ප්‍රසම්පාදනය කර ගැනීම සඳහා පෞද්ගලික සමාගමකට රු. 3,425,341ක් ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මොඩියුල ගණනාවකින් සමන්විත පරිගණක ගිණුම්කරණ තොරතුරු පද්ධතියට කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය අනිකුත් අතිරේක මොඩියුල 2013 සැප්තැම්බර් 30 දින වනවිටත් සපයා නොතිබුණි.

(ii) නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරයකු (තොරතුරු හා තාක්ෂණ) යටතේ නිලධාරීන් 10 දෙනකුගෙන් සමන්විත තොරතුරු හා තාක්ෂණ අංශයක් පැවතියදී සහ සැපයුම්කාර තාක්ෂණික ආයතනය විසින් සංස්ථාවේ අවශ්‍යතාවයන්

හදුනාගෙන අවශ්‍ය තාක්ෂණික යෝජනා ඉදිරිපත් කළ යුතුව තිබියදී ප්‍රසම්පාදන කටයුත්තට අදාලව සම්බන්ධීකරණ නිලධාරියකු ලෙස කාර්යය පැවරුම් පදනම මත බාහිර පුද්ගලයෙකු සේවයේ යොදවා රු.312,500ක මුදලක් ගෙවා තිබුණි.

(iii) පරිගණක පද්ධතිය ස්ථාපනය කිරීමේදී අවශ්‍යවන server යන්ත්‍ර මිලදී ගැනීමකින් තොරව මාසික බදුකුලී පදනම මත එක්තරා සන්නිවේදන ආයතනකින් එකී පහසුකම ලබාගෙන තිබුණු අතර ඒ සඳහා 2012 වර්ෂය තුළ රු.611,933ක මුදලක් ගෙවා තිබුණි.

3.3 **මෙහෙයුම් ආකාර්යක්ෂමතා**

(අ) අම්පාර රඹකැන් ඔය ජලාශයට යටවන භූමියේ දැව ඉවත් කිරීමේදී සිදුව තිබුණු අක්‍රමිකතා හා වන අපරාධ හේතු කොට ගෙන රජයට රු. 35,169,565 ක පාඩු සිදුවීම.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) වන සංරක්ෂක ජනරාල්ගේ 2012 අගෝස්තු 27 දිනැති අංක FIM/HC/01/05 දරන ලිපිය අනුව අනවසරයෙන් කඩියම්පිටිය රක්ෂිතය, නෙල්ලියද්ද කලැව හා නුවරගල රක්ෂිතයේ මායිම් සීමා ඉක්මවා යමින් ඝන ඩෙසි මීටර් 431,310 ක වන ගස් 1,196 ක් ඉවත් කර තිබුණි.

(ii) අනුමත ප්‍රදේශයෙන් බැහැරව ගස් කපා හෙලා තිබුණු අතර 2013 සැප්තැම්බර් 30 දින වනවිටත් මොනම ආකාරයකට හෝ රාජ්‍ය දැව සංස්ථාවට පවරා නැති මොණරාගල දිස්ත්‍රික්කයට අයත් බිම් කොටස්වල විශාල වශයෙන් ගස් කපා හෙලා තිබුණි.

(iii) මෙලෙස අනවසරයෙන් හෙලා ඇති ගස් මුල්වල පිහිටීම GPS භාවිතයෙන් ලබාගන්නා ලද දත්ත ඔස්සේ විශ්ලේෂණය කිරීමේදී හෙලා ඇති ගස් විශාල ප්‍රමාණයක් ජලාශයට යටවන ජල මට්ටම ඉක්මවා පිහිටා තිබුණි.

(iv) සම්පූර්ණ වැඩබිම් තුළින්ම සපයාගත් දැව ඉතා අඩුමිලකට තක්සේරු කර අලෙවි කිරීම හා ඉතා හොඳ තත්ත්වයේ දැව උප ශ්‍රේණිගත කිරීම . (හොඳ තත්ත්වයේ කඳන් නොවන බව තීරණය කිරීම) තුළින් රජයට ලැබිය යුතු ආදායම විශාල වශයෙන් අහිමි කර තිබුණි.

(v) මෙලෙස බැහැරින් කපා හෙලු ගස්වලින් ලබාගත් දැව කැලය තුළ විවිධ ස්ථානයන්හි රැස්කර එම දැව කඳන් වැඩි ප්‍රමාණයක් වැඩබිම් තුළ වු දැව ලෙස අදාළ ලේඛනයන්හි සටහන් කර තිබුණි.

(vi) දැව ගබඩා සැපයීමට වඩා මංසල අලෙවියට වැඩි ප්‍රමුඛත්වයක් දී ඇති අතර වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ගණන් බැලීම අනුව සුඛෝපභෝගී පන්තියේ සිට 2 පන්තිය දක්වා වූ දැව ඝන මීටර් 2,676.57 ක් ගබඩා සපයා අලෙවි කරනවා වෙනුවට මංසල අලෙවි කිරීම නිසා රජයට අහිමි වී තිබුණු මුදල රු. 35,169,605 ක් විය.

(ආ) මොණරාගල පලාරුව තේක්ක වන වගාවේ පූර්ණ හෙළීම් සිදු කිරීම

ටෙන්ඩර් මණ්ඩල විසින් කොන්ත්‍රාත්කරුවන් වෙත වැඩබිම් පවරාදීම පිණිස නියමකර තිබූ දිනයන් හා කොන්ත්‍රාත්කරුවන් විසින් වැඩබිම්වල දැව සැපයීම් කටයුතු ආරම්භ කර තිබුණු දිනයන් අතර කාලසීමාව දින 14 දින සිට දින 115 ක පරාසයක වූ අතර දැව සැපයීම් සඳහා කොන්ත්‍රාත්කරුවන් සමඟ එළඹ තිබුණු ගිවිසුම්වල වලංගු කාලසීමාව ඉක්ම යාමටත් ප්‍රථම පෙර ගිවිසුමෙහි වලංගු කාලසීමාව ආවරණය වන පරිදි කොන්ත්‍රාත්කරුවන් සමඟ නැවත කෙටි වැඩ ගිවිසුම්වලට එළඹ තිබුණි.

## 3.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

**බූස්ස ගෘහභාණ්ඩ නිෂ්පාදනාගාරය සඳහා Finger Joinitng යන්ත්‍රයක් මිලදී ගැනීම**

(අ) Finger Jointing යන්ත්‍රයක් රු. 6,190,950 ක් ගෙවා මිලදී ගෙන වර්ෂයකට වැඩි කාලයක් ගතවුවද 2013 සැප්තැම්බර් 30 දින වනවිටත් කිසිදු නිෂ්පාදනයක් වෙළෙඳපොලට ඉදිරිපත් කර නොතිබූ අතර ව්‍යාපෘතිය ආරම්භ කිරීමට පෙර ශක්‍යතා අධ්‍යනයක් (Feasibility Study) සිදුකර නොතිබුණි. අවශ්‍ය අනෙකුත් යන්ත්‍ර වෙනුවෙන් තවදුරටත් රු. මිලියන 54.4ක් වැයවන බවත් දන්වා තිබුණි. Finger Jointing නිෂ්පාදන වර්ග තීරණය කර ඒ පිළිබඳ පිරිවැය විශ්ලේෂණයක් කර අලෙවි මිල නියම කර නොතිබුණි.

(ආ) මෙම යන්ත්‍රයේ වගකීම් කාලය වසර 1 1/2 කාලයක් ගතවී තිබුණත් නිෂ්පාදන කටයුතු ආරම්භ නොකිරීම නිසා යන්ත්‍රය ක්‍රියාකිරීමේදී මතු විය හැකි කාර්මික දෝෂ හදුනාගෙන ඒවා නියෝජිත ආයතන ලවා සම්පූර්ණ කරවා ගැනීමට ඇති ඉඩකඩ මගහැර ගොස් තිබුණි

(ඇ) Finger Jointing යන්ත්‍රය සඳහා දැනට දරා ඇති වියදම් සහ යන්ත්‍ර පද්ධතියට අවශ්‍ය අනෙකුත් යන්ත්‍ර හා විදුලිබල සම්බන්ධතාවය මෙන්ම කර්මාන්ත ශාලාවේ ඉඩ පහසුකම් ආදිය සියල්ලම සලකා බැලූ විට මෙම ආයෝජනය ආර්ථික වශයෙන් වාසිදායක වී නොතිබුණි.

## 3.5 නිෂ්ඵල ආයෝජන

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2001 වර්ෂයේ රු. 468,000 ක මූලික වියදමක් දරා සංස්ථාව විසින් බද්ධ ව්‍යාපාරයක් ආරම්භ කර රු. 30,000,000 ක් ලංකා ටිම්බර් ප්ලාන්ටේෂන් සමාගමෙහි ආයෝජනය කර තිබුණද 2013 සැප්තැම්බර් 30 දින වනවිටත් කිසිදු ප්‍රතිලාභයක් සංස්ථාව වෙත ලැබී නොතිබුණි.

(ආ) 1985 සැප්තැම්බර් 26 දින සංස්ථාව විසින් ඉඩම් ගොඩකිරීම හා සංවර්ධනය කිරීමේ පෞද්ගලික සමාගමෙහි ආයෝජනය කර තිබූ රු. 500,000 ක කොටස් ආයෝජනය සම්බන්ධයෙන් 2013 සැප්තැම්බර් 30 දින වනවිටත් කිසිදු ප්‍රතිලාභයක් සංස්ථාව වෙත ලැබී නොතිබුණි.

3.6 **ආර්ථික නොවූ ගණුදෙනු**

**මුදලට විකුණුම් ඉන්වොයිස් පොත් මුද්‍රණය හා සැපයීම්**

(අ) වැඩිම මිලගණන් වූ එකක් රු.1,250 බැගින් මුද්‍රිත පොත් මිලදී ගැනීම නිසා සංස්ථාවට සිදුවූ අලාභය රු. 1,870,000 කි.

(ආ) මුද්‍රණ කටයුතු සඳහා රජයේ මුද්‍රණාලයාධිපතිගෙන් කිසිදු විමසීමක් සිදු කර නොතිබුණු අතර පෞද්ගලික මුද්‍රණ ආයතනයකට භාරදීමට පෙර අදාල අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතියද ලබාගෙන නොතිබුණි.

3.7 **කාර්ය මණ්ඩල පරිපාලනය**

භාණ්ඩාගාරය විසින් අනුමත කළ සේවක සංඛ්‍යාව 2364ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසානයේ තථ්‍ය සේවක සංඛ්‍යාව 2187 ක් විය.

3.8 **වාහන උපයෝජනය**

2012 වර්ෂය තුළදී සංස්ථාවට අයත් වාහනවලට සිදුවූ වාර්තා ගත අනතුරු සංඛ්‍යාව 19ක් වූ අතර ඉන් වාහන 9 (නමයක්) පමණක් අලුත්වැඩියා කිරීමට රු.1,268.637ක මුදලක් වැයකර තිබුණි. අලුත්වැඩියා කරන ලද වාහන 9 (නමය) වෙනුවෙන් රක්ෂණ වන්දි වශයෙන් රු.1,081,354ක් ලැබී තිබුණි. නමුත් 2012 වර්ෂය තුළදි වාහනවලට සිදුවූ අලාභ හානි ගණනය කර ගිණුම් ගත කර නොතබුණි.

4. **ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

4.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2004 පෙබරවාරි 24 දිනැති අංක 01/2004 දරන භාණ්ඩාගාර චක්‍රලේඛයෙහි 6.1.1 ඡේදය හා 2003 ජුනි 02 දිනැති අංක PED 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය ප්‍රකාරව මූල්‍ය

වර්ෂය අවසන් වී දින 60 ඇතුළත ගිණුම් විගණනය සඳහා විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කර තිබුනේ 2013 මැයි 06 දිනදීය.

4.2 **සංයුක්ත සැලැස්ම සහ උපක්‍රමික සැලැස්ම**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයෙහි 5.1.1 ඡේදය ප්‍රකාරව වර්ෂ 03 කට නොඅඩු කාලපරිච්ඡේදයකට බල පැවැත්වෙනසේ සංයුක්ත සැලැස්මක් පිළියෙල කළ යුතු වුවද රාජ්‍ය දැව සංස්ථාව විසින් 2008-2012 කාලපරිච්ඡේදය සඳහා පමණක් සංයුක්ත සැලැස්මක් පිළියෙල කර තිබුණි.

(ආ) යථෝක්ත චක්‍රලේඛයෙහි 5.1.3 ඡේදය ප්‍රකාරව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද හා යාවත්කාලීන කරන ලද සංයුක්ත සැලැස්මෙහි පිටපත් මූල්‍ය වර්ෂය ආරම්භවීමට අඩුතරමින් දින 15 කට ප්‍රථම රේඛීය අමාත්‍යාංශයට, මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවට හා විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුවේ. ඒ අනුව සංස්ථාව විසින් 2013 වර්ෂය ආවරණය වන පරිදි සංයුක්ත සැලැස්මක් පිළියෙල කර අදාළ ආයතන වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ගැසට්පත්‍ර මඟින් සංස්ථා කාර්යයභාරය පුළුල්කිරීම යටතේ දක්වා තිබූ පහත සඳහන් අරමුණු සංයුක්ත සැලැස්මෙහි සහ උපක්‍රමික සැලැස්මෙහි අරමුණු තුළ ඇතුළත් කර නොතිබුණි.

(i) දැව අතුරු භාණ්ඩ නිෂ්පාදනය හා අලෙවිය
(ii) වන රෝපනය, වන ප්‍රතිරෝපනය හා වන වගාවන් විද්‍යානුකූලව පාලනය කිරීම
(iii) කෘෂිකර්මික නිෂ්පාදනය
(iv) වන ආශ්‍රිත නිෂ්පාදන පිරිසැකසුම
(v) වේවැල් අපනයනය කිරීම

4.3 **ක්‍රියාකාර සැලැස්ම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) තොරතුරු හා තාක්ෂණ, පිරිස් හා පාලන යනාදී අංශයන්ද ඇතුළත් වන සේ ක්‍රියාකාර සැලැස්මක් පිළියෙල කළ යුතු නමුත් සංස්ථාව විසින් පිළියෙල කර තිබූ ක්‍රියාකාර සැලැස්ම දැව හා දැවමය භාණ්ඩ නිෂ්පාදනය හා අලවිය පමණක් ඇතුළත් ලේඛනයක් විය.

(ආ) සංස්ථාව විසින් පිළියෙල කර තිබූ උපක්‍රමික සැලැස්මෙහි, ක්‍රියාකාර සැලැස්මෙහි හා කාර්තුමය වාර්තාවල දක්වා තිබූ අයිතමයන්ගේ වටිනාකම්වල අසමානතාවයන් නිසා සත්‍ය කාර්යසාධනය මැනීම සඳහා උපයෝගීකර ගැනීමට කුමන අගයන් භාවිතා කරන්නේද යන්න නිශ්චිත නොවිය.

## 4.4 ප්‍රසම්පාදන සැලැස්ම

ප්‍රසම්පාදන සැලැස්ම අයවැය හා සමගාමීව පිළයෙළ කර නොතිබුණි.

## 4.5 අයවැය ලේඛනමය පාලනය

අය වැයගත සහ තත්‍ය ආදායම් හා වියදම් අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වු අතර අයවැය ලේඛනය ඵලදායි කලමණාකරන පාලන ක්‍රමයක ලෙස යොදවාගෙන නොතිබුණි. අයවැය ලේඛනයෙහි ඉරු දැව පිරිවැටුම රු.425,200,000ක් ලෙස පෙන්වා තිබුණද සංසථා ක්‍රියාකාර සැලැස්මෙහි ඉරු දැව පිරිවැටුම රු.1,050,200,000 ක් ලෙස දක්වා තිබුණි.

## 4.6 පාරිසරික හා සමාජ වගකීම් ඉටුකිරීම

ගස් හෙලීම් සඳහා බිම් කට්ටි නිදහස් කිරිමේදී වන ගහණය සහ වන ආවරණය හැකි තරම් දුරට ආරක්ෂා වන පරිදී කටයුතු කළයුතු වුවද, සංස්ථාව විසින් එයට අනුකුල නොවන පරිදී කටයුතු කළ අවස්ථා තිබුණි. විස්තර පහත දැක්වේ.

### (අ) සම්පත් නුවර ප්‍රදේශයේ ස්වභාවික වනාන්තරයක ගස් 392 ක් හෙලීම

ඉහත කරුණට අදාල රාජ්‍ය නොවන සංවිධානයක් විසින් රාජ්‍ය දැව සංස්ථාව වග උත්තරකාර පාර්ශවයක් කරමින් අභියාචනාධිකරණයේ නඩුවක් පවරා තිබූ අතර එක් තනි ගසක් හෙලීම් කළද ඒ සඳහා අවශ්‍ය නීතිමය පියවරයන් අනුගමනය කරන ලෙස රාජ්‍ය දැව සංස්ථාවට අධිකරණය විසින් නියෝග කර තිබුණි.

### (ආ) බංගලාවත්ත වැපල්ටන් වාණිජ තුනීකිරීම් බිම් කට්ටියේ අනවසර හෙළීම්

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) බංගලාවත්ත වැපල්ටන් වාණිජ තුනීකිරීම් බිම් කට්ටියේ දැව හෙලීමේදී අනවසරයෙන් රු. 32,462,148 ක් වටිනා ගස් හෙලා ඇති බවත් , එම අනවසර හෙලීම් වැලැක්වීමට රාජ්‍ය දැව සංස්ථාව ක්‍රියා නොකිරීම හා ඒවාට බලපත්‍ර ලබාදීම හා සිල්පර බවට පරිවර්තනය කිරීමට දැව සංස්ථාවේ නිලධාරීන් සෘජුවම අනුබල දී ඇති බවට චෝදනා 09 ක් ඉදිරිපත් කර තිබුණි.

(ii) මේ සම්බන්ධව පරීක්ෂා කර බැලීම සඳහා පරිසර අමාත්‍යාංශය මගින් පත්කරන ලද නිලධාරීන් 6 දෙනෙකුගෙන් යුත් කමිටුව මගින් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව මගින් නගා ඇති චෝදනා සියල්ලටම හා අතිරේක චෝදනා 5 කටද අක්‍රමිකතා සිදු වී ඇති බවට 2012 මැයි 15 දින තහවුරු කර තිබුණි.

(iii) රාජ්‍ය දැව සංස්ථාවේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මෙහෙයුම්) විසින් 2012 ජුනි 12 දිනැතිව සාමාන්‍යාධිකාරී අමතන ලද ලිපියක් මගින්ද නිර්දේශ හතරක් ඉදිරිපත් කර ඇත. ඒ අනුව අංක 1 සිට 3 දක්වා වූ නිර්දේශ සඳහා ක්‍රියාමාර්ගයක් ගත් බවට සාක්ෂි ඉදිරිපත් වී නොතිබුණි.

(iv) එසේම වන සංරක්ෂක ජනරාල්ගේ 2012 අප්‍රේල් 25 දිනැති තහවුරු කර ඇති පරිදි සිදුවී ඇති වන අපරාධය සම්බන්ධයෙන් වගකිවයුතු නිලධාරීන්ට විනයානුකූලව කටයුතු කර නොතිබුණි.

## 5. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර සංස්ථාවේ සභාපතිවරයා වෙත දන්වා යවන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතුය.

(අ) ණයගැති පාලනය
(ආ) ණයහිමි පාලනය
(ඇ) අයවැය පාලනය
(ඈ) ස්ථාවර වත්කම් පාලනය
(ඉ) ප්‍රසම්පාදනය
(ඊ) වාහන පාලනය

-